# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය**

## කතෝලික ධර්මය - I

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

**වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01)කතෝලික සභාව පැවත එන්නේ …………….. යුගයේ සිටය.
1) දිවැසිවරුන්ගේ
2) අපෝස්තුලුවරුන්ගේ
3) ආදිපිතෘවරුන්ගේ
4) සභා පියවරුන්ගේ

02)එළිදරව් පොතෙහි කතෘත්වය ආරූඪ කර ඇත්තේ
1) ශු. ජොහාන් තුමාටය
2) ශු. පේදුරු තුමාටය
3) ශු. මතෙව් තුමාටය
4) ශු. තෝමස් තුමාටය

03)ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුලුවරු සුබ අස්න දේශනා කිරීමට පටන් ගත්තේ
1) ගලීලය හා නසරතයෙනි
2) ජෙරුසලම හා සමාරියෙනි
3) ජෙරුසලම හා ජුදයාවෙනි
4) සිරියාව හා සමාරියෙනි

04)දෙවි සමිඳුණන් වහන්සේ රාත්‍රියේ දි සලමොන් රජතුමාට දර්ශනය වූයේ
1) හේබ්‍රොන්හි
2) බෙතෙල්හි
3) බෙයර්ෂෙබාහි
4) ගිබියොන්හි

05)ජීවන සභා සම්ප්‍රදය යනු
1) ක්‍රිස්තුන් වහන්සේ ගැන ලිඛිතව පවතින දෑ
2) ලේඛනගතව නැති ක්‍රිස්තුන් වහන්සේ කළ කී දෑ
3) ලේඛනගතව කිරීමට සැලසුම් කර ඇති දෑ
4) ක්‍රිස්තුන් වහන්සේ ගැන අනුමාන කර දෑ

06)ශුද්ධ බයිබලයේ පළමු පොත් කාණ්ඩය වන්නේ
1) ඉතිහාස පොත්ය
2) ප්‍රඥා පොත්ය
3) පංච පුස්තකය
4) දිවැසිවර පොත්ය

07)එළිදරව් සාහිත්‍යයේ මෙම සංකේතවලට අදාළ නිවැරදි පිළිතුර වන්නේ
සුදු, රතු, 4, 10

1) සාගතය, මරණය, පූර්ණත්වය, පරිපූර්ණත්වය
2) ජයග්‍රහණය, සාගතය, විශ්වය, පරිපූර්ණත්වය
3) සාගතය, පූර්ණත්වය, මරණය, විශ්වය
4) ජයග්‍රහණය, යුද්ධය හා ලේ වැගිරීම, විශ්වය, පූර්ණත්වය

08)ධනය බලය නොව විනිශ්චය තෝරා ගැනීමට ඥානය ඉල්ලූ රජ වන්නේ

1) සලමොන් රජු 2) සාවුල් රජු 3) හෙරෝද් රජු 4) දවිත් රජු

09)බැටළුවාගේ සංකේතය මගින් ඉදිරිපත් කරන්නේ

1) දේව ජනතාවය 2) දෙවියන් වහන්සේ ය

3) ඊශ්‍රායෙල් ජනතාවය 4) ක්‍රිස්තුන් වහන්සේ ය

10)දේව ආදරයේ හා ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ සංකේතය වන්නේ

1) යෂ්ටියයි 2) කුරුසියයි 3) ඉඟ පටියයි 4) සැරයටියයි

11)රූත් කථාව හා එස්තර් පොත් …………… කෘති දෙකකි. මෙහි හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ

1) ජනප්‍රිය වීර 2) ජනප්‍රිය ධාර්මික

3) ජනප්‍රිය දිවැසි 4) ජනප්‍රිය ඓතිහාසික

12)ගිනිගත් නොදැවෙන පඳුර මගින් ඉදිරිපත් කරන්නේ

1) දෙවියන්වහන්සේගේ බලයයි 2) මෝසෙස් තුමාගේ දුර්වලකමයි

3) මෝසෙස් තුමාගේ කැඳවීමයි 4) දෙවියන්වහන්සේගේ වැඩ සිටීමයි

13)ශු. බයිබලයේ ප්‍රධාන කර්තෘ වන්නේ

1) ක්‍රිස්තුන් වහන්සේ 2) මිනිසාය

3) මෝසෙස් තුමාය 4) දෙවියන් වහන්සේ ය

14)ප්‍රඥාවන්තව කටයුතු කිරීම යනු

1) වඩා පහසු දේ කිරීමයි

2) බුද්ධිය මෙහෙයවා කටයුතු කිරීමයි

3) හැකි දේ පමණක් කිරීමයි

4) යහපත පමණක් තෝරාගෙන කටයුතු කිරීමයි

15)අපෝස්තලික යුගයේ දී ශු. සභාවට මහඟු සේවයක් කළ විශිෂ්ට පුද්ගලයෙකු වන්නේ

1) ශු. ස්තේපන් තුමා 2) ශු. පාවුලු තුමා

3) ශු. තෝමස් තුමා 4) ශු. පේදුරු තුමා

16)ගැලවීමේ ඉතිහාසයේ පරමාර්ථය වන්නේ

1) දැනුම වර්ධනය කිරීමයි 2) දේව සබඳතාව වර්ධනය කිරීමයි

3) දේව විශ්වාසය වර්ධනය කිරීමයි 4) අත්දැකීම් වර්ධනය කිරීමයි

17)ඉරුදින දිව්‍ය පූජාවේ දෙවන කියවීම සඳහා බොහෝ විට උපුටා ගන්නේ

1) පේදුරු තුමාගේ හසුන්ය 2) නීති පොත්ය

3) ඉතිහාස පොත්ය 4) ශු. පාවුලු තුමාගේ හසුන්ය

18)පැරණි ගිවිසුමේ ඇති එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථයක් වන්නේ

1) දානියෙල්ය 2) එළිදරව්වය

3) රාජාවලිය 4) හිතෝපදේශය

19)දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට දයාද කරන ලද්දේ

1) ලේඛන සම්ප්‍රදය තුළිනි
2) ජීවන සභා සම්ප්‍රදය තුළිනි
3) ඓතිහාසික සම්ප්‍රදය තුළිනි
4) වාචික සම්ප්‍රදය තුළිනි

20)ඊශ්‍රායෙල් ජාතියේ නැගීම හා දේව ආශිර්වාදය ලැබීමට හේතු වූයේ

1) ප්‍රේමයේ පනතය
2) දස පනතය
3) ශුද්ධ වූ සභාවේ පනත්ය
4) සමාජ පනත්ය

21)"අන්‍ය ජාතීන්ගේ අපෝස්තුලුවරයා" යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලබන්නේ

1) ශුද්ධ වූ ජොහාන් තුමාවය
2) ශුද්ධ වූ පාවුලු තුමාවය
3) ශුද්ධ වූ පේදුරු තුමාවය
4) ශුද්ධ වූ මතෙව් තුමාවය

22)"කතෝලිකත්වය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ

1) ශු. සභාවේ එකමුතු බවයි
2) ශු. සභාවේ ශුද්ධවන්ත බවයි
3) ශු. සභාවේ විශ්වීය බවයි
4) ශු. සභාවේ දූත කාර්යයි

23)පෘතුගීසි සමයේ ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම වන්නේ

1) ප්‍රැන්සිස්කාන ධර්මදූතවරු
2) ජේසු නිකායික ධර්මදූතවරු
3) දොමිනිකානු ධර්මදූතවරු
4) අගුස්තීනු නිකායික ධර්මදූතවරු

24)ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු කතෝලික සභාව මුහුණදුන් ප්‍රධානම ගැටලුව වූයේ

1) පරිපාලන කටයුතු රජය සතුවීමය
2) පාසල්වල විනය පිරිහීමය
3) පාසල් රජයට පවරා ගැනීමය
4) ධර්මදූතවරුන් නව රටවලට යාමය

25)"දේව ප්‍රසාද නිධානයන්ගෙන් දේව ප්‍රසාද නිධානය" ලෙස හඳුන්වනු ලබන්නේ

1) ප්‍රසාද ස්නාපනය ය
2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය
3) පූජකවරය
4) රෝගීන්ගේ ආලේපනය

26)ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීම පිළිබඳව සඳහන් වන ශුභාරංචිය වන්නේ

1) ශු. මාක් ශුභාරංචිය
2) ශු. ලූක් ශුභාරංචිය
3) ශු. මතෙව් ශුභාරංචිය
4) ශු. ජොහන් ශුභාරංචිය

27)ශු. තෙරේසා මුනිතුමියව හඳුන්වනු ලබන අන්වර්ථ නාමයක් වන්නේ

1) "ජීවමාන සාන්තුවරිය" ලෙසය
2) "දයාවේ දූතිකාව" ලෙසය
3) "සාමයේ දූතිකාව" ලෙසය
4) "ගැලවීමේ මව්තුමිය" ලෙසය

28)දරිද්‍රතාව හේතු කොට ගෙන පීඩා විඳින ජනතාව සඳහා "සුබසෙත් ගෙදර" නම් වාසස්ථානයක් ඉදිකරන ලද්දේ

1) ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමාය
2) ගරු මර්සලින් ජයකොඩි පියතුමාය
3) ගරු මයිකල් රුද්‍රිගු පියතුමාය
4) ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාය

29)තුන්වන දේව පනතට විරුද්ධ ක්‍රියාවක් වන්නේ

1) ශුද්ධ වූ දේ අගරු ලෙස භාවිතා කිරීම
2) සාස්තර ඇසීම
3) නැකතට අනුව වැඩ කිරීම
4) දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගී නොවීම

30)මව්පියන්ට සැලකීමට අප මඟ පෙන්වන දේව පනත වන්නේ
1) හතරවන දේව පනතය
2) හයවන දේව පනතය
3) දහවන දේව පනතය
4) දෙවන දේව පනතය

31)"බලාපොරොත්තුවේ එළිපත්ත" නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ
1) ශු. තෙරේසා මුනිතුමිය
2) ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමාය
3) ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමාය
4) ශු. ජුසේවාස් මුනිතුමාය

32)පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වන්නේ
1) දසයෙන් කොටස දීම
2) වන්දනා ගමන් යාම
3) යාග පූජා පුද කිරීම
4) පවිත්‍ර වීම

33)ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන ලද්දේ
1) පාස්තු ඉරු දින
2) පෙන්තකෝස්ත දින
3) මහ සිකුරාද දින
4) මහ බ්‍රහස්පතින්ද දින

34)"පේදුරු" යන නාමයේ අර්ථය වන්නේ
1) හස්තයය
2) පර්වතය
3) නායකයාය
4) බලය ලත් තැනැත්තාය

35)ශු. පාවුලු තුමාව හිස ගසා මරා දමන ලද්දේ
1) පිලාත් ආණ්ඩුකාරයාය
2) හෙරෝද් අධිරාජ්‍යයාය
3) ඩොමීෂියන් අධිරාජ්‍යයාය
4) නීරෝ අධිරාජ්‍යයාය

36)ශු. සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා වන්නේ
1) ශු. ස්තේපන් තුමාය
2) ශු. මහා ජාකොබ් තුමාය
3) ශු. පාවුලු තුමාය
4) ශු. පේදුරු තුමාය

37)සාවුල්ට ප්‍රසාද ස්නාපනය දෙන ලද්දේ
1) බර්ණබස් විසිනි
2) සාමුවෙල් විසිනි
3) අනනියස් විසිනි
4) ජෝබ් විසිනි

38)පාවුලු තුමා සමඟ දෙවන ධර්මදූත චාරිකාවට සහභාගී වූයේ
1) බර්ණබස් හා ජොහාන් මාක් ය
2) බර්ණබස් හා තිමෝතියස්ය
3) ලූක් තුමා හා සීලස්ය
4) සීලස් හා තිමෝතියස්ය

39)පේදුරු තුමාගේ මහා ප්‍රකාශය සිදුකරන ලද්දේ
1) පිලිප්පි කයිසාරියේ දී ය
2) ජෙරුසලමේ දී ය
3) ගලීලයේ දී ය
4) සිරියාවේ අන්තියෝකියේ දී ය

40)ශු. ජුසේවාස් මුනිතුමා අයත් නිකාය වන්නේ
1) ජේසු නිකාය
2) ඔරතෝරියානු නිකාය
3) අගුස්තීනු නිකාය
4) දෙමිනිකාන නිකාය